පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - විද්‍යාව (කාලය: පැය 4)

සතිය - මාර්තු 4 වන සතිය

9 ශ්‍රේණිය

සැකසුම - යූ.බී.සී.එස්. ප්‍රේමරත්න
ර/නිව්/ කොඩිප්පිලිකන්ද විද්‍යාලය

මාතෘකාව : ඝණ පදාර්ථ මගින් ඇති කරන පීඩනය

මෙම පාඩම අධ්‍යයනයෙන් පසුව :

- එදිනෙදා අත්දැකීම් උදාහරණ ලෙස ගනිමින් පීඩනය සංකල්පය පැහැදිලි කරයි.
- පීඩනය කෙරෙහි බලය හා බලය ක්‍රියා කරන පෘෂ්ඨ වර්ගඵලය බලපාන බව ප්‍රකාශ කරයි.
- ඝන ද්‍රව්‍ය මගින් යෙදෙන පීඩනය කෙරෙහි බලය බලපාන බව පෙන්වා දීම සඳහා උචිත ක්‍රියාකාරකම් සිදු කරයි.

පෙළ පොතේ පිටු අංක 60 හා 61හි ඉහළ ඡේදය හොඳින් කියවන්න. දැන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1. ඔබට පළල් හා සිහින් කරපටි සහිත පොත් බෑග් දෙකක් ඇතැයි සලකන්න. ඉන් ඔබට කරේ දමා යාම වඩා පහසු වන්නේ කවර කරපටිය සහිත බෑගය ද?
2. පීඩනය යනු කුමක්ද?
3. ක්‍රියාකාරකම 5.1 නිවසේදී සිදු කරන්න. එම ක්‍රියාකාරකම මගින් ඔබට තහවුරු වන කරුණු මොනවාද?
4. ක්‍රියාකාරකම 5.3 නිවසේදී සිදු කරන්න. එමගින් ඔබ ලබා ගන්නා නිගමන මොනවාද?

පෙළ පොතේ පිටු අංක 66 හොඳින් කියවන්න. දැන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

5. ඝන ද්‍රව්‍යයක් මගින් පෘෂ්ඨයක් මත ඇති කරන පීඩනයට බලපාන සාධක දෙක නම් කරන්න.
6. ඝන පෘෂ්ඨයක් මත ඝන ද්‍රව්‍යයක් මගින් ඇති කරන පීඩනය සෙවීමට සමීකරණයක් ලියා දක්වන්න.

දැන් ඔබ මෙම පාඩම සාර්ථකව අධ්‍යයනය කර ඇත.

Scanned with CamScanner